# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2408/17 – 2024 නොවැම්බර් මස 02 වැනි සෙනසුරාදා – 2024.11.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/114.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය,
නො. 141,
ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

*සහ*

ඇලුමෙක්ස් පීඑල්සී,
පට්ටිවිල පාර,
සපුගස්කන්ද,
මාකොළ.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,


1A – G 042993 – 09 (2024/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මාතලේ, කච්චේරිය පාර, 24/9, ආචාර්ය කේ. ඒ. කීරගල මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන,
ස්වදේශ කටයුතු, පළාත් සභා,
පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2023/114.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

නිදහස් වෙළඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය,
නො. 141,
ආනන්ද රාජකරුණා මාවත,
කොළඹ 10.

*සහ*

ඇලුමෙක්ස් පීඑල්සී,
පට්ටිවිල පාර,
සපුගස්කන්ද,
මාකොළ.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

“ඇලුමෙක්ස් පීඑල්සී හි සේවය කරන සේවකයින්ට 2023 වසරේ අප්‍රේල් මස සිට රු.7500/= ක වැටුප් වැඩි කිරීමක් සිදු කරන ලෙස නිදහස් වෙළෙඳ කලාප සහ පොදු සේවා සේවක සංගමය විසින් කරනු ලැබූ ඉල්ලීමට ඇලුමෙක්ස් පීඑල්සී එකඟ නොවීම මගින් පහත සඳහන් කර ඇති තනතුරු කාණ්ඩවලට අදාළ සේවකයින්ට අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන්ට හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්නත් පිළිබඳව වේ.

1. මෙහෙයුම් සහායක
2. නිෂ්පාදන සුපරීක්ෂක
3. ජ්‍යෙෂ්ඨ නිෂ්පාදන සුපරීක්ෂක
4. තත්ත්ව පාලක
5. ගබඩා පාලක
6. කාර්යාල සහායක ”

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්

2024 ඔක්තෝබර් මස 18 දින
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

EOG 11 - 0005

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.